# සීගිරි කාශ්‍යප රජුගේ යක්‍ෂ සංස්කෘතිය

කාශ්‍යප රජු යනු මෙරට රාජවංශයෙහි සුවිශේෂ පුද්ගලයෙකි. ඔහු පියා මරා රජකමට පත් වූ බව පැවසෙයි. එහෙත් ඔහු සීගිරිය කරවූ තැනැත්තා ලෙස ද ප්‍රසිද්ධ ය. සීගිරියෙහි ගල උඩ තනා ඇති මාළිගාවට ඇතුල්විය හැක්කේ සිංහ කටකිනි. සීගිරිය හෙවත් සිංහගිරිය එසේ නම්කෙරුණේ සිංහ කට නිසා යැයි කියැවෙයි. සීගිරිය අද ඊනියා ලෝක උරුමයක් කෙරී අපෙන් උදුරාගෙන අවසාන ය. ඊනියා ලෝක උරුම අවසානයේ දී පාලනය වනු ඇත්තේ අපට අවශ්‍ය අන්දමට නොව ලෝක කෙරුමන්ට හා මෙරට සිටින ඔවුන්ගේ ගෝල බාලයන්ට අවශ්‍ය අන්දමට ය.

සීගිරිය ගැන ලියැවී ඇති ලිපි ලේඛන බොහෝ ය. ඒ පිළිබඳ ප්‍රකාශ වී ඇති මතවාද ද ඉතා අධික ය. සීගිරිය බලකොටුවක් ය එසේත් නැත්නම් සීගිරි කාශ්‍යප රජු කුවේරයා මෙන් ජීවත්වීමට තනාගත් මාළිගාවක් ය මහායාන පන්සලක් ය, භාවනා මධ්‍යස්ථානයක් ය ආදී වශයෙන් විවිධ උපකල්පන කෙරී ඇත. එසේ ම සීගිරි චිත්‍රවලින් නිරූපණය වන්නේ කවුරුන්ද යන්න පිළිබඳ ව ද නොයෙකුත් මත පළ කෙරී ඇත. ඇතැමුන්ට අනුව සීගිරි චිත්‍රවලින් දැක්වෙන්නේ අප්සරාවන් ය. තවත් සමහරකු ඒ දකින්නේ කාශ්‍යප රජුගේ දියණියන් මල් රැගෙන ඒ අසල පිහිටි පිදුරංගල විහාරයට යන ගමනක් නිරූපණය වන්නක් ලෙස ය. ඒ චිත්‍ර භාවනානුයෝගිව වැඩ විසූ භික්‍ෂූන්වහන්සේට ධ්‍යාන වැඩීම සඳහා අඳින ලද චිත්‍ර ලෙස දකින්නෝ ද වෙති.

මෙයින් පැහැදිලි වන්නේ දැනට දන්නා පරිදි සීගිරිය අනන්‍ය ස්ථානයක් බව ය. අනන්‍ය වූවක් ගැන නිශ්චිත අදහසක් ප්‍රකාශකිරීම තරමක් අපහසු ය. අප ඒ පිළිබඳ ව කරන උපකල්පන තවත් එයට සමීප වූවක් සමග සංසන්දනය කර පරීක්‍ෂාකිරීමේ අවස්ථාවක් නො ලැබීම එයට ප්‍රධාන හේතුවක් වෙයි. සීගිරිය නිර්මාණය කරනු ලැබුයේ කාශ්‍යප රජු විසින් ම ද යන ප්‍රශ්නය ද ඇතැමුන් නගන්නේ ද එවැන්නක් වෙනත් තැනක නොමැති නිසා ය.

සීගිරිය වැනි අනන්‍ය නිර්මාණයක් කළ තැනැත්තා කවුරුන් විය හැකි ද? ඔහු පීතෘ ඝාතකයකු විය හැකි ද? යන ප්‍රශ්නය ද මෙහි දී නැගෙන බව අමතක නොකළ යුතු ය. ධාතුසේන රජුගේ අනෙක් පුතා වූ මුගලන් කුමරු දඹදිවට පැන ගියේ ඇයි? ඔහු කාශ්‍යප රජුට බියේ පැන ගියේ ද? මුගලන් කුමරු එතරම් යහපත් පුද්ගලයකු නොවන බව වංසකතාවලින් ම පැහැදිලි වෙයි. දඹදිවින් ආපසු පැමිණ කාශ්‍යප රජු ඝාතනය කර රජකමට පත්වීමෙන් පසු ඔහු හැසිරී ඇත්තේ රකුසකු විලසින් ය. එහෙත් පීතෘඝාතක කාශ්‍යප රජු එවැනි රකුස් පාලනයක් ගෙන ගිය බව වංසකතාවලින් නිගමනය කළ නො හැකි ය.

එහෙත් වංසකතා කාශ්‍යප රජුට දක්වා ඇත්තේ යහපත් ආකල්පයක් නො වෙයි. එයට හේතුව වන්නට ඇත්තේ කාශ්‍යප රජු ථේරවාදී බුදුසමයට පැහැදීමක් නොවීම යැයි සිතිය හැකි ය. ථේරවාදයට හිතවත් නොවූ රජවරුන්ට වංසකතාකරුවන්ගේ අනුකම්පාවක් නොවූ බව පැහැදිලි ය. මහසෙන් රජු මෙන් ම පසු කලෙක ජීවත්වූ සීතාවක රාජසිංහ රජුට ද මේ විරුද්ධාකල්පය විය. දොන් ජුවන් ධර්මපාල රජුට ද ඒ විරුද්ධත්වය විය.

මේ විරුද්ධත්වය බොහෝ විට දක්වන්නේ ථේරවාද භික්‍ෂූන්වහන්සේ හා ගිහි නායකයන් බව ද පෙනී යයි. සාමාන්‍ය ජනතාව එහි දී කිනම් විරුද්ධත්වයක් දැක්වූයේ ද යන්න පැහැදිලි නැත. රජවරුන් මෞර්ය වංශයට අයත්විණි ද, එසේත් නැත්නම් ලම්බකර්ණ වංශයට අයත්විණි ද යන්න හෝ කාලිංග මාඝ රජු මෙන් විදේශික සම්භවයක් තිබිණි ද යන්න හෝ රජුන්ට සේවය කිරීමේ දී වැදගත් සාධකයක් බවට පත් වී නැත. ප්‍රශ්නය වී ඇත්තේ රජු කිනම් ගෝත්‍රයක හෝ කිනම් සම්භවයක් සහිත වී ද හෝ යන්න නොව ථේරවාද බුදුසමයට හිතවත් ද නැත් ද යන්න ය.

මේ සම්බන්ධයෙන් භික්‍ෂූන්වහන්සේට හෝ ප්‍රභූ ගිහි නායකයන්ට හෝ දොස් පැවරිය නො හැකි ය. අඩුම තරමින් පස්වැනි සියවසේ සිට උන්වහන්සේගේ හා ප්‍රභූන්ගේ කාර්යභාරය වී ඇත්තේ සිංහල ථේරවාද බුදුසසුන රැකීම ය. රටේ ස්වෛරීභාවය රැකීම හා ථේටවාද බුදුසසුන රැකීම දෙකක් නොව එකක් වේ ය යන හැඟීම විශේෂයෙන් ම භික්‍ෂූන්වහන්සේලා අතර තහවුරු වී ඇත. ධාතුසේන රජුගෙන් පසුව මේ ආකල්පය තවත් දැඩිවන්නට ඇත. දකුණු දඹදිවින් පැමිණි දෙමළ ආක්‍රමණ මුලින් ම ඇති වී තිබින්නේ ඒ රජු රජවීමට ටික කලකට පෙර ය. දෙමළ ආක්‍රමණ

© Prof. Nalin De Silva

පරදවා රජ වූ ධාතුසේන රජුගෙන් පසුව ඉක්මනින් ම රටේ ස්වෛරීභාවය නැවතත් නැතිකර ගැනීමේ අවශ්‍යතාව භික්ෂූන්වහන්දෙස්ට කිසිසේත් ම නොතිබෙන්නට ඇත.

ධාතුසේන රජු කලින් සඳහන්කර ඇති ආකාරයට යක්ෂ ගෝත්‍රික බිසවක ද සරණ පාවා ගන්නට ඇත. යක්ෂ ගෝත්‍රිකයන් සතුටු කිරීමත් ඔවුන් රාජ්‍ය විචාරයට හවුල් කරගැනීමත් ඒ විවාහය ඔස්සේ සිදුවන්නට ඇත. එහෙත් ඒ විවාහයෙන් ලැබුණු කාශ්‍යප කුමරුට රජකම දීමට ධාතුසේන රජුවත් මහාවිහාරික භික්ෂූන්වහන්සේවත් සූදනම් නොවූ බව පැහැදිලි ය. කාශ්‍යප කුමරුගේ ථෙරවාදයට තිබූ අකමැත්ත ද මෙහි දී බලපාන්නට ඇත. අර්බුදය හටගන්නට ඇත්තේ එසේ යැයි සිතිය හැකි ය. ඇතැම්විට ධාතුසේන රජතුමා කාශ්‍යප කුමරු රජකම ඉල්ලූ විට කලාවැව රාජ්‍යයට සමාන යැයි කියන්නට ඇත.

ධාතුසේන රජතුමාගේ සොහොයුරියගේ පුතා මිගාර සෙනෙවි යැයි කියැවෙයි. ඇතැම් විට මිගාර සෙනෙවිගේ පියා යක්ෂ ගෝත්‍රිකයකු වන්නට ඇත. රජකම ලබාගැනීම සඳහා කාශ්‍යප කුමරුට මිගාර සෙනෙවිගේ ආධාරය ලැබීණී යැයි සිතිය හැකි ය. මේ අරගලය කාශ්‍යප කුමරු විසින් ධාතුසේන රජු මරා රජකම ලබාගැනීමෙන් කෙළවර වී යැයි වංසකතාවලින් කියැවෙයි. ධාතුසේන රජු මරා දැමුව ද නැත් ද  කාශ්‍යප කුමරු අඩුම තරමින් ධාතුසේන රජු සිරකර රජවන්නට ඇත.

එහෙත් ප්‍රශ්නය වනුයේ කාශ්‍යප රජුට ජනතාවගෙන් හෝ ප්‍රභූවරුන්ගෙන් හෝ විශාල විරෝධයක් එල්ල නො වීම ය. මෙය මහසෙන් රජුට එල්ල වූ විරෝධය සමග සංසන්දනහ කළ යුතු ය. මහසෙන් රජු ද යක්ෂ ගෝත්‍රික බිසවකගේ පුතකු ලෙස සැළකෙයි. ඔහු දකුණු දඹදිවෙන් පැමිණි සංඝමිත්‍ර නම් තන්ත්‍රයානික භික්ෂුවක සමග එක් වී මහාවිහාරය සමතලා කර එහි උඳු වැපිරූ බව කියැවෙයි. පැහැදිළිව ම මහසෙන් රජු සිංහල ථෙරවාදයට එරෙහි ව ක්‍රියාකර ඇත. ඔහුට විරුද්ධව රටේ කැරැල්ලක් පැන නැගුණි.

ඒ කැරැල්ලේ නායකත්වයෙහි මේඝවර්ණ වැනි ඇමතිවරු සිටිය හ. මහාවිහාරික භික්ෂූන්වහන්සේ ද මහසෙන් රජුට විරුද්ධ වන්නට ඇති බව අමුතුවෙන් කිවයුතු නො වේ. මේ කැරැල්ල පසුව සමාදන වී මහසෙන් රජු තමන් කළ වැරදි පිළිගෙන මහාවිහාරය ඇතුළු වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කර ඇත. රජුට විරුද්ධ ව කැරැල්ලක් ඇතිවීමත් රජු සමාව ගැනීමත් තමා කළ වැරදි නිවැරදි කිරීමත් මෙහි දී කියැවෙන ප්‍රධාන කරුණු අතර වෙයි.

එහෙත් කාශ්‍යප රජු සම්බන්ධයෙන් එවැන්නක් නො කියැවෙයි. රජුට විරුද්ධව ජනතාව හෝ ප්‍රධාන ඇමතිවරුන් හෝ නැගී සිටි බවක් නො පෙනෙයි. එපමණක් නොව මුගලන් කුමරු දඹදිවට පැන ගියේ ය. ඔහු ගියේ සේනා සංවිධානය කරගෙන පැමිණීමට ය. වෙනත් වචනවලින් කියන්නේ නම් මුගලන් කුමරු කුලී හමුදා ලබාගැනීමට දඹදිව ගියේ ය. මෙරටට දඹදිවින් කුලී හමුදා ගෙන එම ඇරඹූ තැනැත්තා  මුගලන් කුමරු විය යුතු ය. ඒ නරක ආරම්භයක් බව අමුතුවෙන් කිවයුතු නො වෙයි.

ඒ කෙසේ වෙතත් ඉන් කියැවෙන්නේ මුගලන් කුමරුට මෙරට සේනා සංවිධානය කරගැනීමට නොහැකි වූ බව ය. එයට හේතු කිහිපයක් තිබෙන්නට හැකි ය. කාශ්‍යප රජු ඉතා දරදඬු පාලනයක් ගෙන ගිය බැවින් කිසිවකුටවත් ඔහුට විරුද්ධ ව සේනා සංවිධානයක් නොව වචනයක් කතාකිරීමට පවා නොහැකි වූවා විය හැකි ය. එසේත් නැතහොත් හෝ ඒ සමගම හෝ මෙරට ජනතාවගෙන් විශාල බහුතරයක් කාශ්‍යප රජුට පක්ෂපාති වූවා විය හැකි ය. එසේත් නැතහොත් අපට අද සිතාගත නොහැකි හේතුවක් වූවා විය හැකි ය.

මෙහි දී අපේ අවධානයට යොමු විය යුත්තේ භික්ෂූන් වහන්සේ මෙහි දී දැක්වූ ආකල්පය ය. උන්වහන්සේ ඉතා පැහැදිළිව ම භාශ්‍යප රජුට විරුද්ධවූහ. භික්ෂූන් වහන්සේගේ සහාය ලැබුණේ මුගලන් කුමරුට ය. උන්වහන්සේ ඔහු ආපසු එනතුරු බලා සිටියහ. මුතලන් කුමරු ආපසු පැමිණීමෙන් පසුව භික්ෂූන් වහන්සේගේ සහාය ලැබුණේ ඔහුට ය. ඔහු රජවීමෙන් පසුව රකුසු පිළිවෙතක් අනුගමනය කළ බැවින් පසුව භික්ෂූන් වහන්සේගේ අප්‍රසාදයට ලක්විය. එහෙත් භික්ෂූන් වහන්සේ මුගලන් කුමරුට විරුද්ධ නො වූහ.

© Prof. Nalin De Silva

ඇතැම්විට මෙරට ප්‍රභූවරුන් ද මුගලන් කුමරුට පක්ෂපාතිවන්නට ඇත. ඒ පක්ෂ වූ ප්‍රභූවරුන් වැඩි පිරිසක් යක්ෂ ගෝත්‍රිකයන් යැයි සිතිය නො හැකි ය. ඒ එසේ වුව ද මේ ප්‍රභූන්ට ද භික්ෂූන් වහන්සේගේ පක්ෂපාතීත්වය මැද වුවත් කාශ්‍යප රජුට විරුද්ධ ව සේනාවක් සංවිධානය කිරීමට නො හැකි විය. එයට හේතුව වන්නට ඇත්තේ සාමාන්‍ය ජනතාව (බොහෝ යක්ෂ ගෝත්‍රියිකයන් ද ඇතුළුව) කාශ්‍යප රජුට පක්ෂපාති වීම නිසා විය හැකි ය. මුගලන් කුමරු දඹදිවට ගොස් ආපසු එනතුරු ම කාශ්‍යප රජුට කිසිම කරදරයක් නැතිව රජකම් කිරීමට හැකිවීම මගින් පෙන්නුම් කරන්නේ එක්කෝ කාශ්‍යප රජුගේ පරම ඒකාධිපතිත්වයකි. එසේත් නැතහොත් රජුට ජනතාවගේ කැමැත්තක් නැතත් අඩුම තරමින් විරුද්ධත්වයක් නොවූ බව ය.

කාශ්‍යප රජු ඒකාධිපතියකු ලෙස ජනතාව පෙළු බවක් සඳහන් නොවන බැවින් අපට නිගමනය කිරීමට සිදුවන්නේ ජනතාව හා ඇතැම්විට ප්‍රභූන් ද ඔහුට විරුද්ධ නොවූ බව ය. එහෙත් කාශ්‍යප රජු ථෙරවාදී බුදුසසුන රැකගැනීමට කටයුතු කර ඇති බවක් නො පෙනෙයි. ථෙරවාදයට ඔහුගේ ඇල්මක් තිබෙන්නට නැත. ඔහුගේ යක්ෂ සංස්කෘතිය හා චින්තනය හේතුකොටගෙන ඔහු භික්ෂූන්වහන්සේ සමග ආරවුල් ඇතිකර ගන්නට ඇතැයි සිතිය හැකි ය. එවැනි ආරවුල් සමග අනුරාධපුරයේ ජීවත්වනවාට වඩා සීගිරිය වැනි තැනක ජීවත්වීමට කාශ්‍යප රජු කැමැත්තක් දක්වන්නට ඇත.

මෙහි දී අපට සෙනරත් පරණවිතාන මහතා දක්වන අදහස ගැන ද සිත යොමුකිරීමට සිදුවෙයි. පරණවිතාන මහතාට අනුව කාශ්‍යප රජුට කුවේරයා මෙන් ජීවත්වීමේ ආශාවක් තිබී ඇත. වත්මන් කැනීම්වලින් හෙළිදරවු වී ඇති පරිදි සීගිරියේ සුන්දර උද්‍යානයක් තිබී ඇත. සීගිරි චිත්‍රවලින් හෙළිවන්නේ රජුගේ කලාකාමීත්වය ය. යක්ෂ සංස්කෘතිය අප හිතනවාට වඩා කලාවට නැඹුරු වූ සංස්කෘතියක් වී ඇති බව පැහැදිලි ය. සංගීතය, චිත්‍රකලාව, නැටුම්, ඔවුන්ගේ සංස්කෘතියේ අංග වූ බවට සැකයක් නැත. කුවේණියට යක්ෂ ගෝත්‍රිකයන් නැසීමට විජයට ආධාරකිරීමට හැකිවී ඇත්තේත් විවාහයක දී පැවැත්වූ සංගීත උත්සවයක් හේතුකොටගෙන ය. සීගිරියෙන් පෙන්වන්නේ මූලික වශයෙන් ම කාශෘ්‍යප රජුගේ  යක්ෂ සංස්කෘතිය යැයි කිවහැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva